# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 12,220 —1960 ඔක්තෝබර් 28 වැනි සිකුරාද — 28.10.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම්

**1960 අංක 467**

අ.ආ.කා. අංකය : J.8 (V)

1960වෙ ඔක්තෝබර් 31 වැනි දින සිට දිවයිනෙන් බැහැර දින දහනවයක් විවේක නිවාඩු ගතකරන රාජ නීතිඥ, ගරු එච්. එච්. බස්නායක අග්‍රවිනිශ්වය කාරතුමා නොමැති කාලය තුළ, අග්‍රාණ්ඩුකාරතුමා විසින්, උසාවි ආඥපනතේ (6 වැනි අධිකාරය) 9 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, 1946යේ හා 1947තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජාඥවල 52 වැනි වගන්තිය යටතේ, ලංකාද්වීපයෙහි අග්‍රවිනිශ්වයකාර ධුරයෙහි වැඩ බැලීම සඳහා 1960 ඔක්තෝබර් 31 වැනි දින සිට, ගරු ඊ. එච්. ටී. ගුණසේකර කණිෂ්ඨ විනිශ්වයකාරතුමා පත් කළ බව, මෙයින් දනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1960 ඔක්තෝබර 28 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කායර්‍යාලයේදී.
10–128/1

---

**1960 අංක 468**

අ.ආ.කා. අංකය : J 83/47 (II)

ගරු ඊ. එච්. ටී. ගුණසේකර කණිෂ්ඨ විනිශ්වයකාරතුමා ලංකාද්වීපයෙහි අග්‍රවිනිශ්වයකාර ධුරයෙහි වැඩ බලන කාලය තුළ, අග්‍රාණ්ඩුකාරතුමා විසින්, 1946යේ හා 1947තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජාඥවල-53 වැනි වගන්තිය යටතේ, 1960 ඔක්තෝබර 31 වැනි දින සිට අධිකරණ සේවා කොමිෂන් සභාවේ තාවකාලික සාමාජිකයෙකු වශයෙන් ගරු ඇම්. සී. සන්සෝනි කණිෂ්ඨ විනිශ්වයකාරතුමා පත් කළ බව, මෙයින් දනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1960 ඔක්තෝබර 28 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කායර්‍යාලයේදී.
10—128/2

---

## ආණ්ඩුවේ නිවේදන

### 1955 අංක 7 සහ 1957 අංක 30 දරණ ආහාර සැපයීමේ (සංශෝධන) පනත්වලින් සංශෝධිත

### 1947 අංක 30 දරණ ආහාර සැපයීමේ ආඥපනත

**ආඥපනතේ 4 (2) වගන්තිය යටතේ කෙරෙන නියෝගය**

වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ඇමති තැන්පත් ටිකිරි බණ්ඩාර ඉලංගරත්න වන මම 1947 අංක 30 දරණ ආහාර සැපයීමේ 4 (2) වගන්තියෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, අංක 12,198 සහ 1960 සැප්තැම්බර් 13 වෙනි දින දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ 1960 සැප්තැම්බර් 9 වනද දතමින් මවිසින් පළකරණ ලද නිවේදනය මගින් සංශෝධනය කොට ඇති ආඥපනතේ උප ලෙඛනයට ''උම්බලකඩ, වියලි බොනිටෝ මාළු සහ වෙනත් එවැනි හෝ එලෙස පිළියෙල කරන ලද මාළු වර්ග'' යන වචන එකතු කිරීමෙන් එකී උපලේඛනය මෙම නියෝගයෙන් වෙනස් කරමි.

ඒ හේතුවෙන් එම උප ලේඛනය දැන් පහත සඳහන් පරිදි කියවේ.

උපලේඛනය

වී,
හාල්,
තිරිඟු,
තිරිඟු පිටි,
සීනි,
ඉන්දියා සමූහාණ්ඩුවේ නිපදවා පිටරට යවන තල් සූකිරි හැර වෙනත් සූකිරි,
ඉන්දියා සමූහාණ්ඩුවේ සහ පකිස්ථානයේ නිපදවා පිටරට යවන හකුරු හැර වෙනත් හකුරු,
රතුළූනු,
කොල්ලු, පියළි නොකළ මසූර්, පියළි කළ කොල්ලු, මසූර් පරිප්පු,
උම්බලකඩ, වියලි බොනිටෝ මාළු සහ වෙනත් එවැනි හෝ එලෙස පිළියෙල කරන ලද මාළු වර්ග,

ටී. බී. ඉලංගරත්න,
වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ඇමති.

වාණිජ, වෙළඳ, ආහාර සහ නැව් කටයුතු පිළිබඳ අමාත්‍යාංශය (ආහාර අංශය)
330, යූනියන් පෙදෙස, කොළඹ 2.
1960 ඔක්තෝබර් මස 26 දින.
10—113

---

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

945—ජේ. ඇන්. ආර් 13045—4,350 (10/60)